# 9 ස්නාවක ජුවාම් තුමා



9.1 රූපය - ස්නාවක ජුවාම් තුමා

පැරණි ගිවිසුම

මට පෙරටු ව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නාවූ මාගේ දූතයා මම එවන්නෙමි.
(මලාකි 3:1)

නව ගිවිසුම

ඔහු ඉශ්‍රායෙල්වරුන් බොහෝ දෙනෙකු ඔවුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේ වෙත හරවන්නේ ය.
(ලූක් 1:16)

පැරණි ගිවිසුමේ සඳහන් වන පරිදි ජේසුස් වහන්සේට පෙරටුව යමින්, උන්වහන්සේගේ පණිවිඩය පිළිගනු සඳහා ජනතාව සූදානම් කිරීම ස්නාවක ජොහන් තුමාගේ වගකීම විය. ස්නාවක ජොහන් තුමාගේ උපත දේව දූතයකු විසින් එතුමාගේ පියා වූ සෙකරියස් තුමාට දැනුම් දෙනු ලැබිණි.

පූජක නිල පිළිවෙළින් ස්වාමීන් වහන්සේගේ ශුද්ධස්ථානයට පිවිස සුවඳ දුම් පූජා කිරීමේ වාරය, දදු දැමීමෙන්, සෙකරියස්ට පැවරිණි. ස්වාමීන් වහන්සේගේ දූතයෙක් ඔහුට දර්ශනය විය. සෙකරියස් ඔහු දැක කැළඹී බියපත් විය. දේව දූතයා ඔහුට කතා කොට, "සෙකරියස්, බිය නොවන්න. මන්ද, ඔබේ යාච්ඤාව අසනු ලැබී ය. ඔබේ බිරිඳ වන එලිසබෙත් ඔබගෙන් පුතෙකු ලබන්නී ය.
(ලූක් 1:9-13)

එම දේව පණිවිඩය අදහා ගත නොහැකි වූ සෙකරියස් තුමා දේව දූතයාගෙන් මෙසේ විමසා සිටියේ යඃ

මා මෙය දැනගන්නේ කෙසේ ද? මම මහල්ලෙක්මි; මාගේ භාර්යාව ද වයස්ගත ව සිටී.
(ලූක් 1:18)

දේව පණිවිඩය අවිශ්වාස කළ සෙකරියස් තුමාට විපාක හිමි විය.

බලන්න, නියම කාලයෙහි ඉටුවන්න යන, මා කී දේ ඔබ අවිශ්වාස කළ බැවින්, මේ කාරණා සිදු වන දවස දක්වා ඔබ කතා කළ නොහැකි ව නිහඬ වනු ඇත.
(ලූක් 1:20)

සෙකරියස් තුමා හා එලිසබෙත් මහලු ව සිටිය දී ඔවුනට දුන් දරුවා වෙන කිසිවකු නොව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පෙරමග සළසන්නා වූ ස්නාවක ජොහන් තුමා ය. එම උපතින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැති බව ය. එය ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියට වදාළ වචනවලින් ද සනාථ වේ:

බලන්න, ඔබේ ඥාතිවරිය වන එලිසබෙත් ඇගේ මහලු වයසේ දී පුතකු පිළිසිඳගත්තා ය. වඳ යයි කී ඇයට දැන් සවැනි මාසය ය. මක්නිසා ද, දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ යි කීවේ ය.
(ලූක් 1:36)

ගාබ්‍රියෙල් දේවදූතයා සකරියස් තුමාට ස්නාවක ජුවාම් තුමාගේ උපත පිළිබඳ දැනුම් දෙන අවස්ථාවේ දී ම එතුමා පිළිබඳ ප්‍රකාශ කරන ලද ප්‍රධාන කරුණු කිහිපයකි. එතුමාණන්ට ශුද්ධාත්ම මෙහෙයවීම තුළින් විශේෂ කාර්යභාරයක් ඉටු කිරීමට කැඳවීම ලැබිණි.

ඔහු ස්වාමීන් වහන්සේ අබිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේ ය. ඔහු මිදියුසවත්, මත්පැන්වත් නොබොන්නේ ය. මව්කුස සිට ම ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්නේ ය.
(ලූක් 1:15)

සහෝදර දයාවෙන් පරිපූර්ණ ව මරිය තුමිය තම ඥාතිවරිය වූ එලිසබෙත් තුමිය බලන්නට ගොස් එතුමියට ආචාර කළා ය.

එලිසබෙත් මරිය තුමියගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට වන.

මේ අවස්ථාවේ දී ස්නාවක ජොහන් තුමා ජම්ම පාපයෙන් නිදොස් වූ බව ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම යි.

ස්නාවක ජුවාම් තුමා උපත ලබා දින අටක් ගතවූ පසු සිරිත් පරිදි චර්මඡේදන පිළිවෙත සිදු කිරීමට හා නම් දීමට සුදානම් වූ අවස්ථාවේ සෙකරියස් තුමා දේව දූතයා කී නම ප්‍රකාශ කළ පසු ඔහුගේ ගොළු බව දුරු විය.

ඔහු ලියන ලෑල්ලක් ඉල්ලාගෙන, "ඔහුගේ නම ජොහන් ය"යි ලිවී ය. සියල්ලෝ ම මවිත වූහ. එකෙණෙහි ම ඔහුගේ කතා ශක්තිය ලැබිණි.

(ලූක් 1:63)

මෙලෙස විශේෂිත උපතක් මගින් දේව කැඳවීමක් ලද ස්නාවක ජොහන් තුමාට පැවරුණු දේව කාර්ය වන්නේ මෙසියස් තුමාණන්ගේ, එනම් වඩින්නට සිටින තැනැන් වහන්සේගේ පෙරමග සුදනම් කිරීම යි. එතුමා තම දූත කාර්යය ජෝර්දන් ගඟ අවටින් ආරම්භ කරනු ලබයි.

ඔහු ජෝර්දන් ගඟ අවට පෙදෙස මුළුල්ලෙහි සැරිසරමින්, පව් කමාව පිණිස පසුතැවී සිත් හරවා ගෙන බෞතීස්ම ස්නාපනය ලබන්නැයි ප්‍රකාශ කළේ ය.

(ලූක් 3:3)

මේ අයුරින් තම දූත මෙහෙවර අරඹන මෙතුමා අභියෝගාත්මක ආකාරයෙන් ඉශ්‍රායෙලයේ ප්‍රභූ ජනතාව මෙසේ ඇමතී යː

එම්බා පොළොං වංශය, එන්න තිබෙන උදහසින් පලා යන්න නුඹලාට අවවාද කෙළේ කවරෙක් ද? එබැවින් ආබ්‍රහම් අපේ පියාණෝ යයි සිතින් කියාගන්න පටන් නොගෙන මනස්ථාප වූ බව දක්වෙන ලෙස හැසිරෙන්න.

(ලූක් 3:7-8)

මෙම ඇමතුමෙන් පෙන්නුම් කරන්නේ ආබ්‍රහම් තුමාගේ පරපුරට අයත් වීම නිසා ම ගැලවීම නොලැබෙන බව ය. ඒ සඳහා මනස්ථාප වීම අවශ්‍ය බව ය; සිත්හැරීමක් අවශ්‍ය බව ය. එලෙස ම අප ද ප්‍රසාද ස්නාපනය ලැබූ පමණින් ගැලවීම ලැබිය නොහැකි ය. අපගේ පාපවලට මනස්ථාප වී සැබෑ සිත් හැරීමකින් යහපත් ජීවිතයක් ගත කළ යුතු වෙමු.

ස්නාවක ජොහන් තුමාගේ දේශනවලට සවන් දුන් ජනතාවගේ ද ප්‍රතිචාරය වූයේ, “ඉතින් අපි කුමක් කළ යුතු ද?” (ලූක් 3:10) යනුවෙන් විමසමින් එතුමන් වෙත පැමිණීම යි. එසේ පැමිණි ජනතාවට, අයකැමියන්ට හා හේවායන්ට දුන් උපදෙස් අද අප සමාජයේ විවිධ ක්ෂේත්‍රයන්හි විවිධ සේවාවන්හි නිරතවන පුද්ගලයන්ට පමණක් නොව, අනාගතයේ රටේ සංවර්ධනයට දයක වීමට අධ්‍යාපනය තුළින් සුදනම් වන තරුණ ඔබට ද අදාළ වේ. ස්නාවක ජොහන් තුමා සිත් හැරීම දේශනා කරමින් අපේක්ෂා කළේ ආකල්පමය වෙනසකි. එය අපගේ හැසිරීම් රටාවේ වෙනසකට කරන ප්‍රබල ආරාධනයකි.

| | එදා | අද |
|---|---|---|
| ජනතාවට (ලූක් 3:11) | ★ අඳන දෙකක් ඇති අය නැති අයට දෙත් වා.<br>★ කෑම ඇති අය කෑම නැති අයට දෙත් වා. | ★ අපට අත්‍යවශ්‍ය දේ පවා බෙදා ගැනීමට ආරාධනා! |
| අයකැමියන්ට (ලූක් 3:13) | ★ නියමිත පමණට වැඩියෙන් අයබදු නොගන්න. | ★ යුක්ති ගරුක ව, සාධාරණ ව තම රැකියාවේ නිරතවන්න.<br>★ අප රටවැසි ජනතාව වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට ආරාධනා! |
| සෙබළුන්ට (ලූක් 3:14) | ★ කිසිවකුගෙන් බලහත්කාරයෙන්වත් බොරු චෝදනා නැඟීමෙන් වත්, කිසිවක් පැහැර නොගන්න.<br>★ ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න. | ★ වැටුපට සරිලන සේවයක් කිරීමටත්, මානව දයාව හා පොදු යහපත පෙරදැරි කරගෙන රටේ යහපත වෙනුවෙන් යුක්තිය ඉටු කිරීමට ආරාධනා! |

එද ස්නාවක ජුවාම් තුමා ඉදිරිපත් කළ නව සමාජ ධර්මය තුළ යුක්තිය, සාධාරණත්වය සාමුහිකත්වය, සහජීවනය, ප්‍රේමය හා දයාව ගැබ් වී ඇත.

ගැලවුම්කරුවාණන්ගේ පළමු පැමිණීමට ජනතාව සූදානම් කිරීමට කැඳවීම ලත් ස්නාවක ජොහන් තුමා මෙන්, උන්වහන්සේගේ දෙවන පැමිණීමට ජනතාව සූදානම් කිරීමේ වගකීම ශුද්ධ වූ සභා මාතාවට ද පෞද්ගලික ව ඔබට ද පැවරෙයි (මාක් 1:2).

ශුද්ධ වූ සභා මාතාව ජනවන්දනා වසරේ ප්‍රධාන කාල දෙකක් වන ආගමන කාලය හා චතාරික කාලය මනස්ථාපයේ කාල ලෙස නම් කර ඇත. මෙම කාල දෙකෙහි දී පමණක් නොව නව සමාජයක් ගොඩනැගීම සඳහා සෑම විට ම, සෑම මොහොතක ම ක්‍රියාකාරී විය යුතු ය. එමෙන් ම ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමට අප සූදානම් විය යුතු ය.

### ස්නාවක ජොහන් තුමාගේ මරණය (මතෙව් 14:1-12)

> හෙරොද්ගේ උපන් දිනය පැමිණි කල හෙරොදියස්ගේ දුව පිරිස ඉදිරියෙහි රඟ පා හෙරෝද්ගේ මන පිනවූවා ය. එහෙයින් ඇය ඉල්ලන කවර දෙයක් හෝ ඇයට දීමට දිවුරුමකින් ඔහු පොරොන්දු විය. ඈ ද සිය මවගේ උපදෙස් අනුව, "ස්නාවක ජොහන්ගේ හිස තැටියක ලා මෙහි දී මට දුන මැනවැ"යි කීවා ය. ඒ ඇසූ රජ අතිශයින් ශෝක විය. එහෙත්, තමාගේ දිවුරුම නිසාත්, තමා සමග සිටි අමුත්තන් නිසාත් ඔහු එම ඉල්ලීම ඉටු කිරීමට අණ දී, කෙනෙකු යවා හිරගෙදර දී ජොහන්ගේ හිස සිඳ වී ය.
>
> (මතෙව් 14:6-10)

මෙතුමාගේ මරණයට ප්‍රධාන ම හේතුව වූයේ එද ගලීලයේ ආණ්ඩුකාර හෙරොද් රජතුමාගේ වැරදි ක්‍රියා හෙළා දකිමින් ප්‍රසිද්ධියේ කතා කිරීම යි. එනම්, තම සොහොයුරාගේ භාර්යාව ඔහු තබා ගෙන සිටීමට විරුද්ධ ව කථා කිරීම යි. රජතුමාගේ බලය ඉදිරියේ පවා සත්‍යය හා ගුණ දහම් ගැන කතා කිරීම ජොහන් තුමාගේ එඩිතර දිවැසිවර කැපවීම විදහා පායි.

> ජොහන් අල්ලා බැඳ, හිර අඩස්සි කර තිබුණේ ය. මෙසේ කෙළේ, "ඇය තබා ගැනීම ඔබට යුතු නැතැ"යි ජොහන් ඔහුට කී බැවිනි. ඔහු ජොහන් මැරීමට අදහස් කළ නමුත්, ජනතාව ජොහන් දිවැසිවරයෙකු ලෙස සැලකූ නිසා, ඔහු ඔවුන්ට බිය ව සිටියේ ය.
>
> (මතෙව් 14:3-4)


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සමාජ තරාතිරම් නොබලා යුක්තිය, සාධාරණත්වය පිළිබඳ ව එඩිතර ව කතා කළ මෙතුමාට මරණය හිමි විය.

දිවැසි කාර්ය තුළ යුක්තිය හා සාධාරණත්වය පිළිබඳ ව එඩිතර ව කතා කළ මෙතුමාට පමණක් නොව ඒ සඳහා ඉදිරිපත් වන්නන්ට ද අද මරණය හිමි වන අවස්ථා අපට දැකගත හැකි ය. උදාහරණ :- ගරු මයිකල් රැද්‍රිගු පියතුමා

ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ ද දිවැසිවරයෙකි/වරියකි. අද සමාජය තුළ සිදු වන අයුක්තිය, අසාධාරණය හා අසත්‍යය වෙනුවෙන් ඔබට ද නැගී සිටිය හැකි ද? එසේ නිර්භීත ව දිවැසි කාර්යයේ නියැලීමේ දී ඔබට බොහෝ දේ අහිමි විය හැකි ය. මොනයම් දේ ඔබට අහිමි වුව ද එම කාර්යයෙන් මඟ හැර යාමට ඔබට නොහැකි ය. එය ඔබගේ කිතුනු වගකීම යි.

**ක්‍රියාකාරකම**

1. ස්නාවක ජොහන් තුමා පොදු ජනතාවට දුන් පණිවිඩය ප්‍රායෝගික කිරීම සඳහා ඔබ කරන කාර්ය **තුනක්** විස්තර කරන්න.
2. ඔබ දිවැසිවරයකු ලෙස කටයුතු කළ අවස්ථාවකට උදාහරණයක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

***ධර්මිෂ්ඨ ජීවිත ගත කරමු.***